මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01 තාක්ෂණික නිලධාරි (II) ශ්‍රේණිය“ආ” බණ්ඩය

අවශ්‍ය සුදුසුකම් (අ) අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් එක් වරකදී ජීව විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් හෝ තාක්ෂණවේදය විෂය ධාරාවෙන් විෂයයන් තුනකින් (03) සමත්ව තිබීම.

සහ

(ආ) තනතුරට අදාල අවම වශයෙන් වසරක පූර්ණකාලීන වෘත්තීය පුහුණු පාඨමාලාවක් සමත්ව තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. මෙම තනතුර සඳහා පුහුණු පාඨමාලාව හෝ ඒ හා සමාන සුදුසුකම අදාළ පීඨයේ පිළිගැනීම මත තීරණය වේ.

බඳවාගනු ලබන්නන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව “පුහුණුවන තාක්ෂණික නිලධාරී” වශයෙන් පත් කරනු ලැබේ. පුහුණු කාලය තුළදී විද්‍යාගාර කාර්මික කටයුතු සහ එම කාර්යයන්ට අදාළවන භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත යුතු අතර එකී ප්‍රවීණතාවයන් සපුරන සේවකභවතුන් පුහුණුවීමේ කාලසීමා අවසන් වීමෙන් පසුව තනතුරෙහි තහවුරු කර තාක්ෂණික නිළධාරී (II ශ්‍රේණිය) “ආ” බණ්ඩය තනතුරට පත් කරනු ලැබේ.

වයස : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය : [U-MT I (III)] - රු. 51,095 – 7x540; 10x640 – 60,575 මාසික කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

02. මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම් : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත් වීම.

වයස : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය : UMT 1 (III) - රු. 51,095-7 X 540; 10 X 640 - 60,575 (මාසික) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් 2026.11.09 දින හෝ ඊට පෙර මාර්ගගත පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත පද්ධතිය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරිම සඳහා, අයදුම්කරුවන් https://uom.lk/vacancies. වෙබ් අඩවිය වෙත පිවිසිය යුතුය. මාර්ගගත අයදුම්පත් ක්‍රියාවලිය 2026.10.25 දින සිට විවෘත වන අතර 2026.11.09 අවසන් වේ.

සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ එක් එක් තනතුරු සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත භාගත කර එම දෘඪ පිටපත (Hard Copy) තමා විසින් සහතික කරන ලද හා සියලුම ඇමුණුම් සමඟ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (අනධ්‍යයන) අංශය, මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2026.11.09 දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් ඉහත පරිදි බාගත කරන තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි ලියාපදිංචි තැපැලෙන් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

අපේක්ෂකයින් කෙටි ලයිස්තුගත කිරීමේ (Shortlist) අයිතිය මොරටුව විශ්වවිද්‍යාලය සතුය. අවශ්‍ය අයදුම්පත් මාර්ගගත ක්‍රමය මගින් යොමු කිරීමේ දී තාක්ෂණික ගැටළු ඇතිවුවහොත් 011- 2640511 දුරකථන අංකය අමතන්න.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව.
2026.10.23